මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/103/02/06(v) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2025.06.18

චක්‍රලේඛ අංක : 21/2025

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විෂයභාර නි.අ.අ/ස.අ.අ.වරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්,

**ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ ඉලක්කගත විෂය සංවර්ධනය සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලබා දීම පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ සංග්‍රහය - 2025**

ඉලක්කගත විෂය සංවර්ධනය සඳහා පාසල් පාදක ප්‍රදාන ලබා දීම සම්බන්ධව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2022.03.30 දිනැති අංක 07/2022 දරන ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ ඉලක්කගත විෂය සංවර්ධනය සඳහා පාසල් පාදක ප්‍රදාන ලබා දීම පිළිබඳ චක්‍රලේඛය, එහි සංශෝධන වන 2022.08.24 දිනැති 07/2022 (i) සහ 2023.05.25 දිනැති 07/2022 (ii) යන චක්‍රලේඛ අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2025.06.20 දින සිට ඉදිරියට බල පවත්වනු ඇත.

02. ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ, ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ඉලක්ක කර ගත් පහත සඳහන් විෂය 13හි සාධන මට්ටම් ඉහළ නැංවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ය. ඒ අනුව, නිර්ණායක මත පදනම් ව තෝරා ගත් ජාතික හා පළාත් පාසල් වෙත පාසල් පාදක මූල්‍ය ප්‍රදානයන් ලබා දීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

<u>අ.පො.ස.(සා.පෙළ) විෂය</u>

- ගණිතය
- විද්‍යාව

<u>අ.පො.ස.(උ. පෙළ) විෂය</u>

- රසායන විද්‍යාව
- භෞතික විද්‍යාව
- ජීව විද්‍යාව
- සංයුක්ත ගණිතය
- ඉංජිනේරු තාක්ෂණවේදය
- ජෛව පද්ධති තාක්ෂණවේදය
- තාක්ෂණවේදය සඳහා විද්‍යාව
- ව්‍යාපාර අධ්‍යයනය
- ගිණුම්කරණය
- ආර්ථික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

03. ඒ අනුව ඉහත විෂයයන් සංවර්ධනය සඳහා මෙම ප්‍රදානය භාවිතයෙන් මේ සමඟ ඉදිරිපත් කරන මාර්ගෝපදේශයට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතියි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ව්‍යාපෘති සඳහා පමණක් මුදල් වැය කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය හා මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළ ව පැන නගින ඕනෑ ම ගැටලුවක් වේනොත් ඒ සම්බන්ධයෙන් අර්ථ නිරූපණය හා තීරණය අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

නාලක කලුවැව
ලේකම්

පිටපත්:

1. විගණකාධිපති
2. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
3. ප්‍රධාන මූල්‍ය නිලධාරි (I, II), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
4. ප්‍රධාන ගණකාධිකාරි (මූල්‍ය), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
6. සියලු ම පළාත් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්
7. සියලු ම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
8. ගණකාධිකාරි (විවිධ ගිණුම්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
9. ගණකාධිකාරි (ගෙවීම්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
10. පළාත් ඉංජිනේරු ප්‍රධානීන්

# ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ ඉලක්කගත විෂය සංවර්ධනය සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලබා දීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය

## 1. හැඳින්වීම

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කර ගෙන ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙන් අපේක්ෂිත පරිවර්තනීය වෙනස වඩාත් සාධනීය ලෙස සාක්ෂාත් කර ගැනීමට පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ මූල්‍ය ප්‍රදාන ලබාදීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් කර ඇත.

ඒ අනුව, මෙම අමාත්‍යාංශයේ එක් එක් විෂයට අදාළ ව සකස් කරනු ලබන නිර්ණායක මත පදනම් ව තීරණය කරනු ලබන ජාතික හා පළාත් පාසල්වලට මෙම මූල්‍ය ප්‍රදාන ලබා දෙනු ඇත. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙන් අපේක්ෂිත පරිවර්තනීය වෙනස තම පාසල වෙත සාධනීය ලෙස ළඟා කර ගනු පිණිස මෙම මූල්‍ය ප්‍රදාන පාසල් බලධාරීන් විසින් ඵලදායී ලෙස උපයෝජනය කිරීම අපේක්ෂා කෙරේ.

තෝරා ගනු ලැබූ ජාතික හා පළාත් පාසල්වල පහත දක්වා ඇති කාර්යයන් එකක් හෝ කිහිපයක් ඉටු කර ගැනීම සඳහා මෙම මූල්‍ය ප්‍රදාන පාසල් සංවර්ධන සමිති ගිණුම් වෙත අවසන් ගෙවීමක් ලෙස සෘජුව ම ලබා දෙනු ඇත. එම ප්‍රදාන, ලබා දී ඇති කාල රාමුව තුළ අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා පමණක් ම භාවිත කර අවසන් කිරීමට පාසල් බලධාරීන් විසින් කටයුතු කළ යුතු ය.

- පාසල් මට්ටමින් සිදු කළ හැකි නඩත්තු සහ අලුත්වැඩියා සිදු කිරීම (විද්‍යාගාර, ගණිතාගාර, තාක්ෂණ පීඨ, විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන සහ කෘෂි විද්‍යාගාර නඩත්තු හා අලුත්වැඩියා කටයුතු)
- අවශ්‍යතා අනුව ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ මිල දී ගැනීම
- උසස් මට්ටමේ ඉගෙනුම් අවකාශවල (Higher Order Learning Spaces) ලී බඩු සහ ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ අලුත්වැඩියා කිරීම (සාමාන්‍ය පෙළ /උසස් පෙළ විද්‍යාගාර, තාක්ෂණ විද්‍යාගාර)
- අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා වන උපකරණ හා සේවා ලබා ගැනීම
- අදාළ විෂයයන්හි විෂයය සංවර්ධනාත්මක ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සිදු කිරීම

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පාසල් පාදක ප්‍රදාන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් පාසල් නායකත්වය හා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත මඟපෙන්වීමක් ලබා දීමට පමණක් අපේක්ෂා කෙරෙන අතර පාසලේ, ඉලක්කගත විෂයයන්ගේ අවශ්‍යතාව අනුව වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීමට බාධාවක් නොමැත.

## 2. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TO/GR/MISCE(IV) හා 2025.04.11 දිනැති දේශීය හා විදේශීය ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල මූල්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම යන මැයෙන් අමාත්‍යාංශ ලේකම් වෙත එවා ඇති ලිපියේ උපදෙස් ප්‍රකාරව දෛනික මුදල් අවශ්‍යතා සඳහා අක්මුදල් කඩිනමින් සැපයීමට මහා භාණ්ඩාගාරයට හැකියාවක් පවතින බැවින් සත්‍ය වශයෙන් ම මුදල් අවශ්‍ය වන විට මුදල් ඉල්ලුම් කරන ලෙස දැනුම් දී ඇත. උදාහරණයක් ලෙස උපකරණ මිල දී ගැනීම වැනි ප්‍රසම්පාදන ක්‍රියාවලි ආරම්භ කිරීමට ප්‍රථම පාසල වෙත මූල්‍ය ප්‍රදාන ලබා දීම තුළින් අදාළ ක්‍රියාවලිය අවසන් වන තුරු ගිණුමේ භාවිත නොකළ මුදල් රැඳී පවතිනු ඇත. එබැවින් අක්මුදල් එක්වර ම අවශ්‍ය නොවන කටයුතු විධිමත්ව ආරම්භ කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් විසින් අදාළ කටයුතු සඳහා ඒ ඒ පාසලට වෙන් වී ඇති මූල්‍ය ප්‍රතිපාදනය සඳහන් කර එම මූල්‍ය ප්‍රතිපාදන සීමාවට යටත්ව අදාළ කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීමට විද්‍යුත්පතිට නිල ලිපියක් නිකුත් කරනු ඇත. එම නිල ලිපිය පාසලට අදාළ මූල්‍ය ප්‍රදානය ස්ථිර වශයෙන් ම ලබා දීමේ සහතිකයක් ලෙස සැලකිය යුතු ය. එම නිල ලිපිය ලද වහා ම අදාළ කටයුතු, 2023.12.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 54/2023 "පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත" සහ එහි සංශෝධනවල සඳහන් විධිවිධාන ප්‍රකාර ව ආරම්භ කළ යුතු ය.

ඒ අනුව පහත දක්වා ඇති පරිදි එක් එක් කාර්යයන් සිදු කිරීමට කටයුතු කළ යුතු ය.

- **භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම**

පාසල වෙත දැනුම් දී ඇති ප්‍රතිපාදන සීමාව තුළ භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීමට කටයුතු කළ යුතු අතර මූලික ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර ආයතන තෝරා ගැනීමෙන් පසු එම ආයතනවලට මිලදී ගැනීමේ නියෝග (Purchasing Order) යොමු කිරීමට ප්‍රථම කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත් සහිතව මෙම අමාත්‍යාංශයේ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අදාළ ප්‍රසම්පාදන තීරණ ඉදිරිපත් කර පාසල් සංවර්ධන ගිණුම වෙත මුදල් බැර කර ගැනීමට කටයුතු කළ යුතු ය.

**ඉතා වැදගත්: පාසල් සංවර්ධන සමිති ගිණුම වෙත මුදල් බැර කිරීමට ප්‍රථම මිල දී ගැනීමේ නියෝග (Purchasing Orders) කිසිදු සැපයුම්කරුවෙකු වෙත නිකුත් කිරීමට කිසිසේත් කටයුතු නොකළ යුතු ය.**

- **භාණ්ඩ හා උපකරණ අලුත්වැඩියා**

ඔබ පාසල වෙත දැනුම් දී ඇති ප්‍රතිපාදන සීමාව තුළ භාණ්ඩ හා උපකරණ අලුත්වැඩියා අවශ්‍යතාව සඳහා වියදම් ඇස්තමේන්තුව සකස් කර කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත්

සහිතව මෙම අමාත්‍යාංශයේ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර පාසල් සංවර්ධන ගිණුම වෙත මුදල් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු ය.

- **ගොඩනැගිලි අලුත්වැඩියා**

ඔබ පාසල වෙත දැනුම් දී ඇති ප්‍රතිපාදන සීමාව තුළ ගොඩනැගිලි අලුත්වැඩියා අවශ්‍යතාව සඳහා වියදම් ඇස්තමේන්තු පළාත් ඉංජිනේරු මගින් සකස් කර කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් මෙම අමාත්‍යාංශයේ, විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත් සහිත ව අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉන්පසු කාර්යයන් ආරම්භ කිරීම සඳහා එම වියදම් ඇස්තමේන්තුවෙන් 50% ක මුදලක් පාසල් සංවර්ධන ගිණුම වෙත බැර කරනු ලැබේ. ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය හා උපදෙස් අනුව ඇස්තමේන්තුගත වැඩ ක්‍රියාත්මක කර ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද බිල්පත් මත පදනම්ව ඉතිරි මුදල් පාසල් සංවර්ධන ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. ඇස්තමේන්තු ප්‍රකාරව සියලු වැඩ අවසන් කළ බවට ඉංජිනේරුවරයාගේ සහතිකය ලබා ගෙන කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට සහ මෙම අමාත්‍යාංශයේ, අදාළ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත් සහිත ව අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත ඉදිරිපත් කළ යුතුය.

සටහන: නියමිත වර්ෂයට අදාළව ඉහත කාර්යයන් ඉටු කර අවසන් කළ යුතු කාලය ඒ ඒ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දැනුම් දෙනු ඇත. එම කාලය තුළ අදාළ කටයුතු නිසි පරිදි ආරම්භ නොකරන පාසල් සඳහා ප්‍රතිපාදන ලබා නොදීමට කටයුතු කරන අතර එම ප්‍රතිපාදන සුදුසු වෙනත් පාසලක් වෙත ලබා දීමට කටයුතු කරනු ඇත.

ඒ අනුව එම කාර්යයන් සඳහා පාසල් සංවර්ධන සමිතිය තුළ ක්‍රියාකාරී කමිටු පත් කර ගනිමින් කාර්යභාරය අවසන් වන තුරු ඒ පිළිබඳ අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම, භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව සටහන්/ලේඛන ගොනු තබා ගැනීම, ලබා දී ඇති කාල රාමුව තුළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම සහ නියමිත කාලරාමුව තුළ දී කාර්යයන් අවසන් කිරීමට අදාළ වගකීම් එම කමිටුවලට පැවරීමට පාසල් බලධාරීන් කටයුතු කළ යුතු ය.

අදාළ කාර්යයන් 2023.12.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 54/2023 සහ එහි සංශෝධනවල සඳහන් විධිවිධාන ප්‍රකාර ව සිදු කළ යුතු ය. මෙම මූල්‍ය ප්‍රදාන උක්ත මාර්ගෝපදේශ අත්පොතෙහි 7.0 ඡේදයෙහි 7.1හි සඳහන් කර ඇති S-1 සිට S-4 දක්වා වන මූල්‍ය ප්‍රභවයන්ට අදාළ ව ලබා දෙන අතර එහි 8.0 ඡේදයෙහි 8.1හි දක්වා ඇති වැය විෂය අංක REX 1, REX 2, REX 5, REX 6 සහ CEX 2, CEX 4, CEX 5 යන පාසල් මූල්‍ය උපයෝජන ක්ෂේත්‍රවලට අදාළ ව පමණක් වියදම් කළ යුතු ය.

පාසල් වෙත ලබා දෙන ප්‍රදාන උපයෝජනය කිරීම සඳහා ඉලක්කගත විෂයයන්ට අදාළ වැඩසටහන්/ක්‍රියාකාරකම් සහ අයවැය ඇස්තමේන්තු ඇතුළත් ව සැලැස්මක් සකස් කළ යුතු අතර ඒ සඳහා චක්‍රලේඛ අංක 54/2023 හි මූල්‍ය බලතල සීමාවට අනුකූල ව අදාළ අනුමැතිය ලබා ගත යුතු ය.

එමෙන් ම මෙම ප්‍රදානයන් අදාළ විෂය හා සම්බන්ධ මෙම අමාත්‍යාංශයේ ශාඛා මගින් එකී විෂයන්හි අරමුණු අනුව එක් එක් විෂයට වෙන් වෙන් ව පාසල් වෙත ලබා දෙන අතර එකී ප්‍රදානයන් සමඟ ඉදිරිපත් කරනු ලබන උපදෙස් ලිපිය ප්‍රකාර ව උපයෝජනය කිරීම සිදු කළ යුතු ය. එම ප්‍රදාන ඍජුව අදාළ විෂය සංවර්ධන කටයුතු සඳහා පමණක් භාවිතා කිරීමට පාසල් ප්‍රධානීන් වග බලාගත යුතු ය.

## 3. මුදල් භාර ගැනීම

අදාළ ප්‍රසම්පාදන තීරණ මෙම අමාත්‍යාංශයේ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ පසු මෙම ප්‍රදානයන් අවසන් ගෙවීමක් ලෙස පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කරනු ඇත. අදාළ මුදල් සංවර්ධන සමිතියේ ගිණුමට බැර වූ වහාම කිසිදු ප්‍රමාදයකින් තොරව අදාළ කාර්යයන් අවසන් කර නියමිත ගෙවීම් සිදුකිරීමට කටයුතු කළ යුතු ය.

ඉන්පසුව විදුහල්පති විසින් ඒ සම්බන්ධයෙන් 2023.12.29 දාතම 54/2023 චක්‍රලේඛයෙන් (ඉදිරියේ දී සිදු කෙරෙන සංශෝධන ද ඇතුළත් ව) ලබා දී ඇති ආකෘතියට අනුව එම ප්‍රදානය ලද බව සඳහන් කරන ලද ලදුපතක්, උපකරණ මිල දී ගැනීමේදී තොග පොත්වල ඇතුළත් කර එම පිටු අංක ද, අනිකුත් කටයුතුවලදී එම කටයුතු නිසි පරිදි අවසන් කළ බවට ලොග් සටහන් යොදා එම ලොග් සටහන් පිටපත් ද සහිතව ආවරණ ලිපියක් සමඟ "ගණකාධිකාරී (ගෙවීම්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" වෙත අනිවාර්යෙන් ම එවිය යුතු ය.

තවද එම ලදුපතෙහි, ආවරණ ලිපියේ හා අනිකුත් ලේඛනවල විදුහල්පති විසින් සහතික කරන ලද ඡායා පිටපත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන) සහ මෙම අමාත්‍යාංශයේ අදාළ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත ද ලැබීමට සැලැස්විය යුතු ය.

## 4. මුදල් වියදම් කිරීම හා ගිණුම් ගත කිරීම

මෙම ප්‍රදාන 2023.12.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 54/2023 "පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යූහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොත" සහ එහි සංශෝධනවල සඳහන් විධිවිධාන ප්‍රකාර ව වියදම් කිරීම හා ගිණුම්ගත කිරීම සිදු කළ යුතු ය. උක්ත මූල්‍ය ප්‍රදාන උපයෝජනය කිරීමේ දී 54/2023 චක්‍රලේඛයේ 14.0 ඡේදයේ 14.1.11 සිට 14.1.15 දක්වා අනු ඡේදයන්හි සඳහන් කර ඇති පරිදි අදාළ සියලු ලැබීම් හා ගෙවීම් "ලැබීම් පාලන ලෙජරයේ" හා "වැය පාලන ලෙජරයේ" නියමිත පිටුවල සටහන් කළ යුතු වේ. එමෙන් ම මෙම ප්‍රදාන ඵලදායී ව නියමිත කාල සීමාව තුළ වියදම් කර අවසන් කළ යුතු ය.

එහෙත්, පාසල වෙත ලබා දුන් මූල්‍ය ප්‍රදාන නියමිත කාර්යයන් වෙත යෙද වූ පසු සුවිශේෂී හේතුවක් මත තවදුරටත් ඉතිරි වන්නේ නම්, එම මුදල මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 7041133 දරන ගිණුමට බැර කිරීම සඳහා චෙක්පතක්, ආවරණ ලිපියක් සමඟ ගණකාධිකාරී (ගෙවීම්), අධ්‍යාපන,

උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල වෙත නොවැම්බර් 15 දිනට පෙර අනිවාර්යයෙන් ම එවිය යුතුය.

## 5. වත්කම් ගිණුම්ගතකරණය

අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 54/2023 හි සඳහන් මාර්ගෝපදේශ අත්පොතෙහි 13.0 ඡේදයෙහි භාණ්ඩ භාර ගැනීම හා පොත්වල සටහන් කිරීම යටතේ 13.6හි සඳහන් කර ඇති ආකාරයට මිල දී ගනු ලබන ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ මිල දී ගත් මාසයට පසු මාසයේ 5 වෙනි දිනට පෙර උක්ත චක්‍රලේඛයේ ඇමුණුම 26 ට අනුව සම්පූර්ණ කර CIGAS වැඩසටහනේ වත්කම් මෘදුකාංගයට ගිණුම්ගත කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයේ ගණකාධිකාරි වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් මෙම අමාත්‍යාංශයේ අදාළ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

මෙම ලේඛන සම්බන්ධ ගොනුවක් පාසලේ නඩත්තු කළ යුතු අතර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්වලට අනුගත විය යුතු ය.

## 6. වාර්තාකරණය

භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව මේ සමඟ ඇති ඇමුණුම 01හි ආකෘතියට අනුව විදුහල්පති විසින් සකස් කර කලාප විෂය සම්බන්ධීකරණ නිලධාරීන් (ගණිත, විද්‍යා, තාක්ෂණ අධ්‍යාපන, කෘෂිකර්ම, වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන) මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නොවැම්බර් 15 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

## 7. නියාමනය හා විගණනය

මෙම ප්‍රදානය ඵලදායී ව උපයෝජනය කරනු ලබන්නේ ද යන්න පිළිබඳ ව, කලාප විෂය සම්බන්ධීකරණ නිලධාරීන් (ගණිත, විද්‍යා, තාක්ෂණ අධ්‍යාපන, කෘෂිකර්ම, වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන) අධීක්ෂණය කර විදුහල්පතිවරුන් විසින් ඇමුණුම 01 ආකෘතියට අනුව ලබා දෙන තොරතුරු යොදා ගනිමින්, ඇමුණුම 02 ආකෘතිය සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතට ඉදිරිපත් කළ යුතු ය.

එකී අදාළ වාර්තාව අනුව පළාත් විෂය සම්බන්ධීකරණ නිලධාරීන් (ගණිත, විද්‍යා, තාක්ෂණ අධ්‍යාපන, කෘෂිකර්ම, වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන) පළාතේ සියලු ම පාසල්වලට අදාළ සමස්ත වාර්තාව ඇමුණුම 03 ආකෘතිය අනුව සකස් කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ විෂයභාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දිය යුතු ය.

මෙම ක්‍රියාවලියට අදාළ සියලු ලේඛන පාසල් සුපරීක්ෂණ, විගණන වැනි කටයුතුවලදී ඉදිරිපත් කිරීම සඳහා අනිවාර්යයෙන් ම ගොනු කර තබා ගත යුතු ය.

ඇමුණුම 01

**ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP)**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**පාසල් පාදක මූල්‍ය ප්‍රදානය**
**පාසල් මට්ටමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම**

**පාසලේ නම :**

**..................................................................................................................................................................**

| SESIP යටතේ ලද මුදල (රුපියල්) | ප්‍රදානය ලද දිනය | ඉටු කරන ලද ව්‍යාපෘතිය/ව්‍යාපෘති/වැඩසටහන | වැය වූ මුදල (රුපියල්) | 202......දිනට භෞතික ප්‍රගතිය | 202.......දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|
| උදා : 300,000.00 | 2025/07/01 | උසස් පෙළ විද්‍යාගාරයට ඉගෙනුම් උපකරණ මිල දී ගැනීම | 280,000.00 | මිල දී ගත් උපකරණ ලේඛනය අමුණා ඇත | 93% | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන : ...............................................

විදුහල්පතිගේ නම හා නිල මුද්‍රාව : ...............................................

දිනය : ...............................................

ඇමුණුම 02

**ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP)**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**පාසල් පාදක මූල්‍ය ප්‍රදානය**
**කලාප මට්ටමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම**

**කලාප අධ්‍යාපන කාර්යාලයේ නම :**
**.........................................................................** **විෂය :..................................................**

| පාසලේ නම | SESIP යටතේ ලද මුදල (රුපියල්) | ප්‍රදානය ලද දිනය | ඉටු කරන ලද ව්‍යාපෘතිය/ව්‍යාපෘති/වැඩසටහන | වැය වූ මුදල (රුපියල්) | 202......දිනට භෞතික ප්‍රගතිය | 202.......දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට නිර්දේශ කරමි.

අත්සන : .............................................

කලාප විෂය භාර අධ්‍යක්ෂගේ නම හා නිල මුද්‍රාව : .............................................

දිනය : .............................................

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන :.................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නම හා නිල මුද්‍රාව :.................................

දිනය :.................................

ඇමුණුම **03**

## ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP)
## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### පාසල් පාදක මූල්‍ය ප්‍රදානය
### පළාත් මට්ටමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව : ........................................................................** **විෂය :.........................................**

| කලාපයේ නම | පාසලේ නම | **SESIP** යටතේ ලද මුදල (රුපියල්) | ප්‍රදානය ලද දිනය | ඉටු කරන ලද ව්‍යාපෘතිය/ව්‍යාපෘති/වැඩසටහන | වැය වූ මුදල (රුපියල්) | **202......**දිනට භෞතික ප්‍රගතිය | **202.......**දිනට මූල්‍ය ප්‍රගතිය | වෙනත් සටහන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට නිර්දේශ කරමි.

අත්සන : ............................................

පළාත් විෂය භාර අධ්‍යක්ෂගේ නම හා නිල මුද්‍රාව : ............................................

දිනය : .............................................

ඉහත සඳහන් විස්තර හා තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

අත්සන :..................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නම හා නිල මුද්‍රාව :..................................

දිනය :..................................